# ආචාර්ය නිමල් සේදර ගේ නවතම කෘතිය නිහඬ බස ජන ගත වෙයි




ආචාර්ය නිමල් සේදර ගේ නවතම කෘතිය නිහඬ බස පසුගියදා ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් නුවර දී දොරට වැඩියේ ය. පුද්ගලයෙකු ගේ අදහස් තේරුම් ගැනීමට ඉරියව් සහ අභිනව ප්‍රයෝජනයට ගන්නා ආකාරය ගැන සම්පාදිත මේ කෘතිය සිංහල භාෂාවෙන් මේ විෂය ආශ්‍රිතව ලියැවී ඇති ප්‍රථම කෘතිය යි. මේ ඡායාරූපයෙන් දිස් වන්නේ නිමල් සේදර මහතා විසින් එහි මුල් පිටපත බ්‍රිස්බේන් නුවර වෙසෙන ශ්‍රී ලාංකික මහාචාර්යවරයකු වන සූරි රාජපක්ෂ මහතාට සහ ට සහ ආචාර්ය පැමලා රාජපක්ෂ මහත්මියට පිරිනමන අවස්තාවයි. මේ පොත සරසවි ප්‍රකාශනයකි.



## Cartoon By Shanika Somatilake




RESIDENTIAL DESIGNS, PERMITS DRAWINGS
RANJ DESIGN & DRAFTING SERVICES
RANJITH WANNINAYAKE

- FREE ADVICES
- PLANS–SINGLE/DOUBLE STOREY/ EXTENSIONS/DECKS/CARPORTS
- PLANNING PERMIT DRAWINGS
- BUILDING PERMIT DRAWINGS

REGISTERED Building Practitioner
bdav
3/19 Balmain Court, Lalor 3075
Tel: 0430 066 241 Email: designrako@gmail.com




ගමක ජීවත් වූ බෙහෙවින් රූමත් තරුණියක් ගැබ්ගත්තා. කෝපයට පත් ඇගේ දෙමව්පියන් දරුවාගේ පියා කව්දැයි විමසුවා. මුල දී පිළිතුරු දීමට මැළි වූ ඇය සියල්ලන්ගේ ම ආදරයට සහ ගෞරවයට පාත්‍ර ව සිටි සෙන් ගුරුවරයකු වූ හකුයින් නම් කළා. ගැබිණියගේ දෙමාපියන් හකුයින් ගුරුවරයා මුණ ගැසෙන්නට ගොස් ඔහුට චෝදනා කළා.

"හැබෑට ?" හකුයින් ප්‍රතිචාර දැක්වුවා.
ප්‍රසූතියෙන් පසු ළදරුවා රැගෙන හකුයින් මුණ ගැසීමට ගිය යෞවනියගේ දෙමාපියන් ඔහුට දරුවාගේ භාරකාරත්වය පැවරිය යුතු බව ප්‍රකාශ කළා.

"හැබෑට ?" හකුයින් නැවතත් කිව්වා.
සෙන් ගුරුවරයා පිළිබඳ ව තිබුණු යහපත් චිත්‍රය අතුරුදහන් වුණා. ගමේ සියලු දෙනා ම ඔහු ගැන කථා කළේ පිළිකුළෙන්. එහෙත් ගුරුවරයා දරුවා සෙනෙහසින් ඇති දැඩි කළා.

මාස ගණනාවක් ගත වුණා. ළදරුවාගේ මවට තවදුරටත් සත්‍ය වසන් කරගෙන සිටීමට බැරි තත්ත්වයක් උද වුණා. ඇය දරුවාගේ සැබෑ පියා ගැන හෙළිදරව් කළා. ඔහු ගමේ ම සිටි තරුණයෙක්. රූමතියගේ දෙමාපියන් නැවතත් හකුයින් මුණ ගැසෙන්නට ගියා.

"අපට සමාවෙන්න ගුරුතුමනි. දරුවාගේ පියා අසුවලා බව අපි දැන ගත්තා."
"හැබෑට ?" හකුයින් නැවතත් පැවසුවා.
සෙන් ගුරුවරයා නැවතත් දරුවා බාර දුන්නා.

**මහින්ද ගුණවර්ධන**

1000 Business Cards + Design $150+gst
420gsm Artboard Full Color Double Side Print Matt Lamination FREE Delivery Australia Wide
Say Hello: 0466 597 991 info@crystald.com.au | www.crystald.com.au

